


# චන්ද්‍රිකා තාක්ෂණය හැදෑරීමට දොරටුවක්

## ආචාර්ය ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය

**1982** වසරේ බ්‍රිතාන්‍ය රජය මඟින්, ආචාර්ය ආතර්. සී. ක්ලාක් වෙනුවෙන් පිරිනැමුණු මාකෝනි සම්මානය සමඟ හිමිවුණු ඇ.ඩොලර් 50,000 ක මුදල් ත්‍යාගය, ඔහු විසින් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පිරිනමනු ලැබුවේ ශ්‍රී ලංකාවේ එතෙක් අඩුවක්ව පැවැති නව තාක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ය. ඒ අනුව 1984 වසරේ දී ශ්‍රී ලංකා රජය විසින් පාර්ලිමේන්තු පනතක් මඟින් ස්ථාපනය කරන ලද නව තාක්ෂණ මධ්‍යස්ථානය, ඔහුට ගරු කිරීමක් වශයෙන් "ආතර්. සී. ක්ලාක්" නමින් නම් කරන ලදී.

මොරටු කටුබැද්දේ විශ්වවිද්‍යාලය ඉදිරිපිට මෙම මධ්‍යස්ථානය පිහිටුවා තිබේ. පණිවුඩ හුවමාරුව, පරිගණක තාක්ෂණය, බලශක්තිය, අභ්‍යවකාශ තාක්ෂණය සහ රොබෝ විද්‍යාව යන ක්ෂේත්‍රයන් හඳුන්වාදීම කඩිනම් කිරීම, මෙය පිහිටුවීමට මුල් වූ සාධක විය.

වර්තමානයේ දී පණිවුඩ හුවමාරුව සහ පරිගණක තාක්ෂණය යන ක්ෂේත්‍ර, මධ්‍යස්ථානය ඔස්සේ ආවරණය වේ. ඒ සඳහා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවන් කණ්ඩායමක් සහ තවත් අදාළ වෘත්තිකයන් නවීන තාක්ෂණයට අදාළ ක්ෂේත්‍රයන් හී දැනුම ව්‍යාප්ත

කිරීමේ කටයුතුවල නියැලී සිටී. මෙය කර්මාන්ත හා විද්‍යා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ පරිපාලනයට යටත් ආයතනයකි. එහි ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් රජය මඟින් දරන අතර ආයතනයේ කළමනාකරණය පාලක මණ්ඩලයක් මඟින් පවත්වාගෙන යනු ලැබේ. මෙහි වත්මන් උපදේශකවරයකු වශයෙන් ශ්‍රී ලංකාවේ සිටින කීර්තිමත් විද්‍යාඥයකු වන ආචාර්ය චන්දන ජයරත්න මහතා ක්‍රියා කරයි.

ආතර්. සී. ක්ලාක් මධ්‍යස්ථානය, දේශීය විශ්වවිද්‍යාල සහ අනෙකුත් කාර්මික ආයතන සමඟ සමීපව කටයුතු කරන අතර, මොරටුව විශ්වවිද්‍යාලය ඒ අතරින් විශේෂිත ය. විදේශීය විශ්වවිද්‍යාල මෙන්ම එක්සත් ජාතීන් ගේ නියෝජිතායතන සමඟ ද ආයතනය සමීපව කටයුතු කරයි.

චන්ද්‍රිකා තාක්ෂණ පිළිබඳ සුවිශේෂී තොරතුරු එකතුවක් ඇති, අප රටේ පිහිටි එකම ස්ථානය ද මෙම මධ්‍යස්ථානයයි. එහි පුස්තකාලය මේ පිළිබඳ නවීනතම පොත් පත් එකතුවකින් සමන්විත ය.

දත්ත භාවිත සටහන්, ඉංජිනේරු විද්‍යාව සඳහා වූ විවරණිකාවන් (bulletins), කාර්මික වාර සඟරාවන් (විශේෂයෙන් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, විදුලි සංදේශ තාක්ෂණය, පරිගණක හා තොරතුරු සැකසීමේ තාක්ෂණයට අදාළ වූ) ඊට ඇතුළත් වේ. ආචාර්ය ආතර් සී. ක්ලාක් පරිහරණය කළ පොත් රැසක් ද පුස්තකාලය සතුව ඇත.

වසරකට රු. 500/- ක් වැනි සුළු මුදලකට පුස්තකාලයේ සාමාජිකත්වය බ්ඹම් කර ගත හැකිය. ෆොටෝකොපි, සී.ඩී. පිටපත් කිරීම වැනි පහසුකම් ද මෙහි වේ.

වර්තමානයේ, මෙම මධ්‍යස්ථානය ප්‍රධාන අංශ පහකින් සැදුම් ලද්දේ වෙයි.

**(1) තොරතුරු තාක්ෂණ අංශය**

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය හා එක්ව විද්‍යා වැඩසටහන ක්‍රියාවට නැංවීම මේ දිනවල මෙම අංශයෙන් කෙරෙන ප්‍රධානතම කර්තව්‍යයකි. මේ යටතේ, ආයතනයේ නිෂ්පාදන මිලදී ගෙන, ග්‍රාමීය පෙදෙස්වල පුහුණු අවශ්‍යතා සඳහා අමාත්‍යාංශය මඟින් නොමිලේ බෙදා දීම සිදු කෙරේ.

සිංහල භාෂාවෙන් පරිගණකය ක්‍රියාත්මක කිරීමේ දී වැදගත් වන, සිංහලෙන් ඊමේල් යැවීම සඳහා "මොසිල්ලා තන්ඩර්බර්ඩ්" මෘදුකාංගය ද වෙබ් සඳහා "මොසිල්ලා ෆයර්ෆොක්ස්" මෘදුකාංගය ද සිංහලට හරවා හඳුන්වා දීම මෙම අංශයෙන් සිදු කෙරුනු සුවිශේෂී සේවාවකි.

**(2) සන්නිවේදන අංශය**

අඩුවියදම් භාණ්ඩ නිෂ්පාදනය, ඇඟලුම් කම්හල්වල කාර්යක්ෂමතාව නැංවීමේ උපකරණ, වීදි ඔරලෝසු කණු සඳහා විද්‍යුත් ක්‍රමයක් හඳුන්වාදීම වැනි කාර්යයන් මෙම අංශයෙන් සිදු කෙරේ. විදුලිබල මණ්ඩලයේ මනු කියවීම හුවමාරු මධ්‍යස්ථානයක (ඥදජඩවදඨඥ) සිට කළ හැකි ක්‍රමයක් පිළිබඳ ද පර්යේෂණ සිදු කෙරමින් පවතී.

(3) ඉලෙක්ට්‍රොනික අංශය

ආරක්ෂක පරිපථ නිෂ්පාදනය කිරීම මෙම අංශයේ ප්‍රධානතම කාර්යභාරයක් වේ.

(4) කර්මාන්ත සේවා අංශය (ISD)

කර්මාන්තශාලාවල උපකරණ අලුත්වැඩියා කිරීම, උපකරණවල නිරවද්‍යතාව පිළිබඳ තත්ත්ව සහතික ලබාදීම, මෙහි සේවාවන් වේ.

(5) තාරකා විද්‍යා අංශය

ලංකාවේ විශාලතම දුරේක්ෂය, මෙම අංශය සතු ය. චන්ද්‍රිකා ආධාරයෙන් ක්‍රියා කරන නවීනතම දුරේක්ෂයන් ද මෙහි වේ. රාත්‍රී අහසේ තාරකා පරීක්ෂාව මෙම අංශයේ කාර්යයකි. පාසල්වලට ගොස් වැඩසටහන් කිරීම ද තාරකා විද්‍යා අංශයෙන් සිදු කෙරේ.

## ආයතනයේ සේවාවන්

නවීන තාක්ෂණ විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයේ සේවාවන් කාණ්ඩ හතරකට බෙදා දැක්විය හැකිය.

1. පර්යේෂණ සහ සංවර්ධන සේවා
2. උපදේශක සේවා
3. වෘත්තිකයන් සඳහා වෘත්තීය පාඨමාලා
4. යෞවනයන් සඳහා පුහුණු පාඨමාලා

## පර්යේෂණ සහ සංවර්ධන කටයුතු

මධ්‍යස්ථානය සතු පර්යේෂණ සහ සංවර්ධන විද්‍යාගාරයන් හි ව්‍යවහාරික පර්යේෂණ සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය, පණිවුඩ හුවමාරුව සහ මයික්‍රොප්‍රොසෙසර් පදනම් වූ දෘඩාංග සඳහා යොදාගත හැකි නවීන උපකරණ සහ පරිගණක පද්ධතීන් අන්තර්ගතය. දේශීයව උසස් තාක්ෂණික භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීමේ අරමුණ ඇතිව මධ්‍යස්ථානය මඟින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයට ම අයත්, ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති භාරගැනෙනු ඇත.

මධ්‍යස්ථානයේ පර්යේෂණ කණ්ඩායම අන්තර්ජාතිකව තරගකාරී පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ද දැඩි කැපවීමකින් ක්‍රියාකරයි.

## උපදේශක සේවා

උසස් තාක්ෂණික කර්මාන්ත පද්ධති පාලනයේ සහ අලුත්වැඩියාවේ හසළ අත්දැකීම් සහ කුසලතා ඇති මධ්‍යස්ථානයේ වෘත්තීය කාර්යය මණ්ඩලය, මයික්‍රොප්‍රොසෙසර් පදනම් වූ යන්ත්‍ර සූත්‍ර ඇතුළත් විදුලි සංදේශ පද්ධති, තොරතුරු පද්ධති සහ පරිගණක ජාල වැනි නවීන කාර්මික පද්ධති කළමනාකරණයට සහයවීමක් වශයෙන් තම ශ්‍රමශක්තිය සහ විද්‍යාගාර පහසුකම් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට ලබා දී ඇත. තවද මධ්‍යස්ථානයේ උපකරණ අංශය සංකීර්ණ උපකරණ සඳහා දෝශ නිර්නය සහ ක්‍රමාංකන සේවාවන් ලබා දීමෙහි සමත් ය.

## වෘත්තිකයන් සඳහා පැවැත්වෙන වෘත්තීය පාඨමාලා

දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වෘත්තිකයන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා පුහුණු පාඨමාලා විටින් විට මධ්‍යස්ථාන මඟින් සංවිධානය කරනු ලැබේ. මෙම කෙටි කාලීන පුහුණු පාඨමාලා, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යා භාවිතයන්, පණිවුඩ හුවමාරුව සහ පරිගණක පද්ධති යන විෂය ක්ෂේත්‍රවලට අදාළ නත්කාලීන තොරතුරු සැපයීම සඳහා ක්‍රියාත්මක කොට ඇත. මෙම කෙටි කාලීන පාඨමාලා සඳහා ප්‍රායෝගික සැසිවාරයන් ද අන්තර්ගත කොට ඇත.

## යෞවනයන් සඳහා පුහුණු පාඨමාලා

තරුණ පුරපුරේ කුසලතා වර්ධනය කිරීම අරමුණු කොටගෙන ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව මෙන්ම අනෙකුත් නවීන තාක්ෂණ තේමාවලට අදාළ වැඩසටහන් මධ්‍යස්ථානය මඟින් සංවිධානය කෙරේ. මින් ඇතැම් වැඩසටහන් මෙරට අනෙකුත් කාර්මික ආයතන හා ඒකාබද්ධව සංවිධානය කෙරේ.

මේ අයුරින් බලන කල, බොහෝ පිරිසක ගේ දැඩි අවධානයට යොමු නොවුනත් ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය යනු ජාතියේ සම්පතකි. නිසි කළමනාකරණය තුළින් එහි උපරිම සේවාව ජනතාවට ලබාදීම ආයතනයේ වගකීමක් සේ ම, එහි සේවාවන් ලබා ගැනීමට ඉදිරිපත් වීමට ජනතාව ගේ පෙළඹීම ද අත්‍යවශ්‍ය වේ.

❑

**තොරතුරු ලබා දීම :**
**මධ්‍යස්ථානයේ ජනමාධ්‍ය නිලධාරී**
**චින්තන**